---

**මැදවච්චිය ප්‍රාදේශීය සභාව**

**අනුරාධපුර දිස්ත්‍රික්කය**

1. **මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 01 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මැයි 14 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 නොවැම්බර් 08 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 **මතය**

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව මැදවච්චිය ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට මැදවච්චිය ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**

(අ) එකතුව රු.293,760 ක්වූ ස්ථාවර වත්කම් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ආ). පිළිසරු ව්‍යාපෘතිය යටතේ ඉදිකෙරෙමින් පැවතුණ ගොඩනැගිලිවල රු.664,735 ක්වූ කෙරීගෙන යන වැඩවල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඇ). රු.201,132 ක්වූ ඉතිරි තොග මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඈ). බැංකුවට සෘජු ප්‍රේෂණ වශයෙන් ලැබුණු රු.131,000 ක් වර්ෂයේ ආදායම් ලෙසද, ලැබිය යුතු රු.915,715 ක්වූ මුද්දර ගාස්තු ලැබිය යුතු ආදායම් ලෙසද, මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඉ). සමාලෝචිත වර්ෂයට අදාලව 2013 වර්ෂයේදී ගෙවන ලද එකතුව රු.13,789 ක්වූ වියදම් උපචිත වියදම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඊ). දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් ලබාගත් ණය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වසරවලදී ගෙවන ලද ණය වාරික සාවද්‍ය අයුරින් ගිණුම් තැබීම නිසා 2012 දෙසැම්බර් 31 දිනට ණය ගිණුමේ ශේෂය රු.1,099,611 ක් වැඩියෙන්ද ආදායම් ගිණුම්ගත කිරීමේදී උපචිත පදනම වෙනුවට මුදල් පදනම යොදා ගැනීම නිසා වර්ෂයේ ආදායම රු.497,505 ක් වැඩියෙන්ද, ගිණුම්වල දක්වා තිබුණි.

### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

වටිනාකම එකතුව රු.43,399,146 ක්වූ ගිණුම් විෂයයන් 17 ක් සඳහා සාක්ෂි නොමැති වීම නිසා එම විෂයයන් සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය/ සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය.

### 1.3.3 නොසැසඳු ගිණුම්

මූල්‍ය ප්‍රකාශන අනුව, ගිණුම් විෂයයන් 06 කට ආදාල ශේෂයන්ගේ එකතුව රු.24,550,743 ක්වූ අතර උපයෝගි ලේඛන/වාර්තා අනුව එම ශේෂයන්ගේ එකතුව රු.34,367,160 ක් විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.3,646,612 ක්වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 3,221,686 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.'000 | රු.'000 | රු.'000 |
| (i). | වරිපනම් හා බදු | 890 | 877 | 1,353 |
| (ii). | බදු කුලී | 3,622 | 2,780 | 2,433 |
| (iii). | බලපත්‍ර ගාස්තු | 1,198 | 1,231 | 506 |
| (iv). | වෙනත් ආදායම් | 1,695 | 2,722 | 6,053 |

#### 2.2.2 බදුකුලී

(අ). 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159(i) වගන්තිය ප්‍රකාරව අයකිරිමට කටයුතු නොකළ හිඟහිටි කඩ කාමර කුලි ප්‍රමාණය රු.831,944 ක් විය.

(ආ). පළාත් පාලන කොමසාරිස්ගේ 1994 අගොස්තු 04 දිනැති අංක එන්සීපී/එල්ජී4/7/19 දරන චක්‍රලේඛය ප්‍රකාරව කඩකාමර කුලී වසර 05 කට වරක් තක්සේරු නොකර, වසර 20 කට පෙර කරන ලද තක්සේරුව මත කඩ කුලී අයකර තිබුණි.

(ඇ). පළාත් පාලන කොමසාරිස්ගේ 1989 සැප්තැම්බර් 30 දිනැති අංක එල්ජී/3 දරන චක්‍රලේඛයේ vii ඡේදයේ විධිවිධාන වලට පටහැනිව අවම ලංසුවට වඩා අඩුවෙන් වෙළඳ අයිතිය බඳුදීම නිසා රු. 449,900 ක ආදායම් අහිමිවී තිබුණි.

### 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු |
|---|---|---|
| (i). | උසාවි දඩ | 2,049,879 |
| (ii). | මුද්දර ගාස්තු | 915,715 |

### 2.3 නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත භෞතික සම්පත්

එකතු වටිනාකම රු.1,702,408 ක් වූ උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍යාංශයන් 2008 වර්ෂයේදි ලැබුණු සහල් පිටි ආශ්‍රිත බේකරි නිෂ්පාදන කට්ටලය සහ ඊට අදාල ගොඩනැගිලි ප්‍රයෝජනයට නොගෙන නිශ්කාර්යව පැවැතුණි.

### 2.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

**පහත කරුණු නිරික්ෂණය කරනු ලැබේ.**

(අ). සභාවේ පුරප්පාඩු තනතුරු 08 ක් සඳහා බඳවා ගැනීම සහ අතිරික්ත සේවකයින් සඳහා තනතුරු අනුමත කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ). ඉදිරි වර්ෂවල ක්‍රියාකාරිත්වයට අදාල සැලසුම් ඇතුළත් සංයුක්ත සැලැස්මක් හා ක්‍රියාත්මක කිරිමට අපේක්ෂිත කාර්යයන් ඉටු කිරීම සඳහා ක්‍රියාකාරි සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි.

**(ඇ)** ජංගම ගිණුමක පැවති රු.150,353 ක ශේෂය 2012 මැයි මාසයේ සිට ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

**2.5 කොන්ත්‍රාත් පරිපාලනය**

(අ). පළාත් ඉංජිනේරුගේ තත්ත්ව පාලන සහතික ලබා ගැනීමෙන් තොරව පිරිවැය රු.6,100,176 ක්වූ කර්මාන්ත 10 ක් සඳහා ගෙවිම් කර තිබුණි.

(ආ). සමාලෝචිත වර්ෂය තුලදී නිම කිරීමට සැලසුම් කර තිබුණු රු.3,255,543 ක් පිරිවැය වු කර්මාන්ත 07 ක වැඩ 2012 දෙසැම්බර් 31 දින වන විටත් නිමකර නොතිබුණි.

**2.6 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 (ඒ) වගන්තිය ප්‍රකාරව උත්සව සඳහා දරන ලද එකතුව රු. 138,425 ක වියදම් සඳහා විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

**3. පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය
(ආ). ආදායම් පරිපාලනය
(ඇ). වත්කම් කළමනාකරණය.